We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
*Immigration Lawyer*
*Migration Agent Reg: 96/86306*

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002

එපමණක් නොව, ඇය මියගිය ආසන්නයේ තිබී ජංගම දුරකථනයක සිම් කාඩ් පතක කුඩා කැබැල්ලක් හමු වී ඇත. එය පරීක්ෂා කර ජංගම දුරකථනයේ සැබෑ අයිතිකරු සොයා ගැනීමට පරීක්ෂණ අංශ ක්‍රියා කළත්, එය සාර්ථක වී නැත.

එය ඉතාමත් කුඩා සිම් කාඩ්පත් කැබැල්ලකි. බෝම්බය පිපිරීමෙන් ජංගම දුරකථනය සම්පූර්ණයෙන්ම පාහේ විනාශයට පත් වී ඇත. එබැවින් එහි කොටස් සහ සිම් කාඩ්පත් කැබැල්ල විදේශීය විශේෂඥයෙකුගේ පරීක්ෂාවට ලක්කර දුරකථනයේ අයිතිකරු සොයා ගැනීමට රහස් පොලීසියේ අභිප්‍රාය වී ඇත.

දැනට ලැබී ඇති යම් යම් තොරතුරුවලට අනුව එහි මූලික පරීක්ෂණවලින් හෙළි වී අත්තේ ශ්‍රී ලංකාවේ කිසිදු දුරකථන සමාගමක එම ජංගම දුරකථනය ලියා පදිංචි කර නොමැති බව ය. එබැවින් මෙය විදේශීය රටකින් රැගෙන විත් භාවිතයට යොදා ඇති බවට සැක කෙරේ.

මේ නිසා මෙම ජංගම දුරකථනයේ අයිතිකරු සොයා ගැනීම ගැටලු සහගත ය. එහෙත් පරීක්ෂණ අංශ එය සොයා ගැනීමට විද්‍යාත්මක හේතු භාවිත කරමින් පරීක්ෂණ කටයුතු ඉදිරියට කරගෙන යයි.

මෙම පරීක්ෂණ කරගෙන යන අතරතුර මීගමුව ප්‍රදේශයේ ජංගම දුරකථන අලෙවි සැලක සේවය කරන අයෙකු පසුගිය දිනක වෙඩි තබා ඝාතනය කර තිබිණි. ඔහු කොටි සංවිධානයට හිතවත් මාතලේ රත්තොට ප්‍රදේශයේ පදිංචි දෙමළ තරුණයෙකි.

කටුනායක ගුවන් තොටුපළට මීට වසර කිහිපයකට පෙර කොටි එල්ල කළ ප්‍රහාරයේ දී බරපතල අලාභයකට මුහුණ දීමට රජයට සිදුවිය. එම ප්‍රහාරයට පැමිණි කොටි සාමාජිකයෙක් භාවිත කළ ජංගම දුරකථනයක් සහ සිම් කාඩ්පත ලබාගෙන තිබුණේ මෙලෙස මරා දමා තිබූ මීගමුවේ දෙමළ තරුණයාගේ දුරකථන අලෙවි සැලෙනි.

හමුදාපතිවරයාගේ ඝාතන ප්‍රයත්නයෙන් දින කිහිපයකට පසු මෙම තරුණයාව වෙඩි තබා මරා දමා තිබුණි. එය කවුරුන් විසින් සිදු කළා ද යන්න ප්‍රශ්නයකි. එබැවින් එය කාගේත් බලවත් සැකයට තුඩුදෙන සිද්ධියකි.

අප්‍රේල් මස 25 වැනි දා පස්වරු 1.35 ට පමණ බෝම්බය පිපිරෙන අවස්ථාවට පෙර සහ පසු කොළඹ යුද හමුදා මූලස්ථානය ඇතුළත හා අවට භාවිත වූ ජංගම දුරකතන අංක සියල්ලම අදාළ ජංගම දුරකථන සමාගම්වලින් ලබා ගැනීමට රහස් පොලීසිය සූදානම් වෙයි.

ඒ අනුව අදාළ කාල වේලාව තුළ වැඩිපුර පණිවුඩ හුවමාරු වූ ජංගම දුරකථන අංක සහ අයිතිකරුවන් හඳුනා ගෙන ඒ ඔස්සේ පරීක්ෂණ පවත්වමින් බෝම්බ ප්‍රහාරයේ වගකිව යුත්තන් සොයා ගැනීමට රහස් පොලීසිය උත්සාහ කරයි.

එපමණක් නොව, හමුදාපතිවරයා ඝාතනය කිරීමේ කොටි ප්‍රයත්නයට හමුදා මූලස්ථානය ඇතුළේම පිරිසකගේ උදව් උපකාර ලැබී ඇත. එසේ නොමැතිව මෙවැනි ප්‍රහාරයන් එල්ල කිරීමේ හැකියාවක් කොටින්ට නැත.

නමුත් යුද හමුදා සෙබළෙක් හෝ නිලධාරියෙක් එලෙස උදව් උපකාර කළා ද? එසේ නැත්නම් හමුදා කඳවුරේ සේවය කරන සිවිල් අයෙක් මෙයට උදව් කළා ද? යන්න පිළිබඳ තවමත් පැහැදිලි සාක්ෂි ලැබී නැත.

කෙසේ වෙතත්, මෙම ප්‍රහාරය සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කොටි සංවිධානය විශාල මුදලක් වැය කර ඇත. එසේ නොමැතිව, මෙවැනි බරපතල ක්‍රියාවකට කොටින්ට ලෙහෙසි පහසුවෙන් සම්බන්ධවීමට හැකියාවක් නැත.

යුද හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා මහතාව ඝාතනය කිරීමට කොටින්ට පමණක් නොව, හමුදාව තුළ සිටින ඇතැම් දූෂිත නිලධාරීන්ට පවා විශාල අවශ්‍යතාවක් ඇත. එම දූෂිතයන්ට හිතේ හැටියට හමුදාව තුළ දූෂණ වංචා වැඩ කිරීමට ෆොන්සේකා මහතාගෙන් හැකියාවක් නැත.

එම නිසා ෆොන්සේකා මහතාව ඝාතනය වෙනවා දකින්නට එම දූෂිතයන්ට ඇත්තේ විශාල ආසාවකි. එහෙත් ඔවුන්ගේ ආසාවන් ඉෂ්ට කිරීමට කොටි බෝම්බකාරියට හැකියාව ලැබුණේ නැත. ඉන් කොටින්ට වඩා දුක්වන්නේ දූෂිත හමුදා නිලධාරීන් වනවාට සැකයක් නැත.

හමුදාපතිවරයාව ඝාතනය කිරීමට කොටි සංවිධානය උත්සාහ කළේ අද ඊයේක සිට නොව, මීට වසර කිහිපයක සිට ය.

හමුදාපතිවරයා 1992 දී සහ 1997 දී කොටි ප්‍රහාර දෙකකට ලක් විය. ඉන් ඔහු ජීවිතය බේරා ගත්තේ අනූනවයෙනි.

එවිට ඔහු හමුදාපති තනතුරට පත්වී නැත. එම තනතුරට පත්වීමට පෙර සිටම ඔහු බිලි ගැනීම කොටින්ගේ අභිප්‍රාය විය. ෆොන්සේකා මහතාට කොටි තර්ජන වේගවත් වූයේ ඔහු මේජර් ජනරාල් තනතුරට පත් වීමෙන් පසුව ය.

අනතුරුව ඔහුව හමුදාපති පුටුවේ වැඩි නොකිරීමට කොටින්ගේ ඒකායන අභිප්‍රාය විය. යම් හෙයකින් ඔහු හමුදාපති තනතුරේ වැඩ භාරගතහොත්, ඉන් තමන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණ පෑමට සිදුවන බව කොටි දැනගෙන සිටිය හ.

එබැවින් ඊට පෙර ෆොන්සේකාව ඝාතනය කිරීමේ සැලැස්ම ක්‍රියාවට නැගිණි. එවිට ඔහු යුද හමුදා ප්‍රධාන මාණ්ඩලික නිලධාරියා වශයෙන් සිටියේය.

ඒ 2004 වර්ෂයේ මුල් භාගය යි. කොටි ඔත්තුකරුවන් කොළඹ පැමිණියේ ෆොන්සේකා මහතාගේ තොරතුරු එක්රැස් කිරීමට ය. ඒ හරහා ඔහුව ඝාතනය කිරීමට කොටි ක්‍රියාත්මක වූවත් යුද හමුදා රහස් තොරතුරු අංශයේ මේජර් සමන් වෙදගම මහතා නිසා එම ප්‍රයත්නය අසාර්ථක විය.

මේජර් සමන් වෙදගම මහතා සිය ඔත්තුකරුවන්ගේ මාර්ගයෙන් ඉතාමත් දක්ෂ ලෙස එම කොටි සැලසුම හෙළිදරව් කරගෙන, එය ලිඛිතව යුද හමුදා රහස් තොරතුරු අංශයේ අධ්‍යක්ෂ මේජර් ජනරාල් කපිල හෙන්දවිතාරණ මහතාට භාර දුන්නේ ෆොන්සේකා මහතාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ය.

එපමණක් නොව විදේශ කටයුතු ඇමැතිව සිටි ලක්ෂ්මන් කදිරගාමර් සහ යුද හමුදා රහස් තොරතුරු අංශයේ ලුතිනන් කර්නල් නිෂාම් මුතාලිෆ් මහත්වරුන් ද කොටි ඝාතනය කිරීමට උත්සාහ කරන බව ද කල්වේලා ඇතිවම ලිඛිතව දැනුම් දුන්නේ මේජර් සමන් වෙදගම මහතා ය.

මේ ආකාරයට වෙදගම මහතා අවස්ථා කිහිපයක දීම ඔත්තු බලධාරීන්ට මේ පිළිබඳව දැනුම් දුන්නත් සැලකිය යුතු ප්‍රතිචාරයක් ඊට ලැබුණේ නැත. එහි අවසාන ප්‍රතිඵලය වූයේ ඇමතිවරයා සහ මුතාලිෆ් මහතා කොටි වෙඩි ප්‍රහාරයකට ලක් වී මරුමුවට පත් වීමය.

මේජර් වෙදගම මහතාගේ ඔත්තු වාර්තාවලට අනුව ආරක්ෂක බලධාරීන් නිසි පියවර ගත්තේ නම්, ඔවුන් දෙදෙනාට ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වන්නේ නැත. ආරක්ෂක බලධාරීන් නිසි පියවර නොගත්තේ මන්ද යන්න ප්‍රශ්නයකි.

හමුදාපති සරත් ෆොන්සේකා මහතා සිය තනතුරට පත් වූ පසු පසුගිය ජනවාරි මස මුල් සතියේ දිනක වෙදගම මහතා හමුදා මූලස්ථානයට ගොස් හමුදාපතිවරයාව පුද්ගලිකව මුණ ගැසී ඔහුට කොටින්ගෙන් ඇති ජීවිත තර්ජන පිළිබඳව දැනුම් දී ඇත. හමුදාපතිවරයාව අප්‍රේල් මාසය ඇතුළත ඝාතනය කිරීමට කොටි දැඩි ප්‍රයත්නයක නිරත වන බව සමන් වෙදගම මහතා ලිඛිතව එම අවස්ථාවේ රහසිගත වාර්තාවක් හමුදාපතිවරයාට භාර දෙමින් ප්‍රකාශ කර ඇත.

එම වාර්තාවේ ඇති කරුණු සනාථ වෙමින් හමුදාපතිවරයාව අප්‍රේල් මස 25 වැනි දා කොටි ප්‍රහාරයකට බඳුන් විය. මේජර් වෙදගම මහතාගේ රහස්‍ය වාර්තාවලට අනුව ආරක්ෂක බලධාරීන් ක්‍රියාත්මක වී තිබුණේ නම්, මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට ඉඩ තිබිණි.

නමුත් ආරක්ෂක බලධාරීන් ෆොන්සේකා මහතාගේ ආරක්ෂාව තර කිරීම පසෙක තබා එම වාර්තාව සකස් කළ මේජර් වෙදගම මහතාව වවුනියාවට මාරුකර යැවීය.

පෙබරවාරි මස 22 - 23 ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවති සාම සාකච්ඡාවල දී කොටි සංවිධානයේ න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් මහතා සාකච්ඡා මේසයට වාර්තාවක් ඉදිරිපත් කරමින් හමුදා ඔත්තු අංශයේ නිලධාරීන් 07 ක් දැඩි විවේචනයට ලක් කළේ ය.

එම නිලධාරීන් තමන්ගේ වැඩ කටයුතුවලට විශාල හිසරදයක් බවත් ඔවුන් කරුණා පාර්ශවය සමඟ එකතු වී තමන්ට විරුද්ධව

9 වන පිටට